කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය
தொழில் தொழிற்சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சு
Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report
2017

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
தேசிய தொழிற் கற்கைகள் நிறுவகம்
National Institute of Labour Studies

නො 267, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල
இல.267, பன்னிபிடிய றோட், பெளவத்த, பத்தரமுள்ள
No 267, Pannipitiya Road, Palawatta, Battaramulla

ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ස්ථාපිත අරමුණු වලට අනුව ශ්‍රම අධ්‍යයන ක්ෂේත්‍රය තුල ශ්‍රමිකයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරිම සහ ඔවුන් තුල යහපත් ආකල්ප ඇති කිරිම සඳහා මෙම වර්ෂය තුල පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුලින් දායකව ඇත.

රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවල කාර්ය මණ්ඩල අරමුණු කරගෙන ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම ආයතනික ඵලදායීතාවය ඉහළ දැමීම තුළින් යහපත් වැඩ පරිසරයක් ඇති කිරිම සඳහා මෙම වැඩසටහන් හේතු වී ඇති බව විශ්වාස කරමි.

මෙම කර්තව්‍ය විධිමත්ව ක්‍රියාත්මක කිරිම සඳහා ජාතිත ශ්‍රම අධ්‍යයන ආයතනයට අළුත් වැඩසටහන් හඳුන්වා දෙමින් පවත්නා වැඩසටහන් නවීකරණය කරගනිමින්, වෙනත් දේශීය අධ්‍යාපන ආයතන මෙන්ම ජාත්‍යන්තර ආයතන සමග සබඳතා ශක්තිමත් කර ගනිමින් හා සිය කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කර ගනිමින් ඉදිරියට ගමන් කළ හැකි ඒ සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය පෙරමුණ ගෙන කටයුතු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ගෙවුනු වර්ෂය තුල ආයතනික ඉලක්ක සපුරා ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාර්ය සපුරා ගැනිම සඳහා දායක වූ ජාතික ශ්‍රම ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට මගේ සුබ පැතුම් පිරිනමමි.

ඩබ් ඩී ජේ සෙනවිරත්න
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

ගරු සභාපතිතුමාගේ පණිවුඩය

ආයතනවල ඵලදායිතාවය ඉහළ නැංවිම සඳහා මෙන්ම කාර්යස්ථාන වල සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් යහපත් වැඩ පරිසරයක් ගොඩනගා ගැනිම සඳහා දැනුම හා කුසලතාවයෙන් පිරිපුන් යහපත් ආකල්ප ඇති පිරිසක් අවශ්‍යයෙන්ම සිටිය යුතුය. ජාතික සංවර්ධනය සඳහා කැපවූ තෘප්තිමත් ශ්‍රම බලකායක් ගොඩනැංවීමේ අරමුණට ඵලදායී දායකත්වයක් ලබාදිය හැකිවන්නේ එමඟිනි. ඒ අනුව රටේ ශ්‍රමික ජනතාව ශ්‍රම අධ්‍යයන ක්ෂේත්‍රය ඔස්සේ පුහුණුව හා සංවර්ධනය තුලින් දැනුවත් කිරිමේ භාරදූර කාර්තව්‍යයෙහි ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයනය නියැලි සිටි. ඒ සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්විම යන පුහුණුව හා සංවර්ධන මෙවලම් ආයතන විසින් ප්‍රයෝජනයට ගෙන ඇත. ඒ ඔස්සේ ඉලක්ක ගත වැඩපිළිවෙලක නියැළි පැහැදිලි ප්‍රවර්ධයන් 2017 වර්ෂය තුල අත් කර ගැනිමට ආයතනය සමත්ව ඇති බව සතුටින් සඳහන් කළ හැකි ය.

වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යභාර්යය සඳහා ආයතනය බාහිර සම්පත්දායකයින්ගෙන් පෝෂණය ලබාගෙන ඇති අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයද ලබා ගෙන ඇත. එහිදී දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන වලින් ලැබි ඇති දායකත්වයද පැසසිය යුතු වේ.

2017 වර්ෂය තුල අමාත්‍යාංශය විසින් සපයන ලද නායකත්වය සහ මගපෙන්විම තුල ඵලදායි ලෙස ඉලක්ක සපුරා ගැනිමට දායක වු ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු එහි සිටින කාර්යමණ්ඩලයට ස්තුතිවන්ත වෙමි.

සභාපති
එස් ඒ නිමල් සරණතිස්ස

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල පුහුණුව හා සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත සහයෝගය දැක්වීමේ අරමුණ ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2017 වර්ෂය පුරා පාඨමාලා වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට කටයුතු කර ඇත. එම පාර්ශවකරුවන් සමග ඇති යහපත් සබඳතා මත ඔවුන්ගේ අදහස් යෝජනා සහ ඉල්ලීම් සැලකිල්ලට ගෙන වැඩසටහන් නවීකරණය කරමින් හා නව වැඩසටහන් හඳුන්වාදෙමින් ඵලදායී ලෙස පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය පියවර ගෙන ඇත. ඒ යටතට ආයතන විසින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා, වැඩමුළු විශේෂ වේ. මේ ආකාරයෙන් ආයතනයේ අවධානය, එය ස්ථාපිත කරන ලද අරමුණු වලට අනුකූලව මේ රටේ ශ්‍රම බලකායට ඔවුන්ගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනයට අවස්ථාව සලසා දෙන අතර ඔවුන්ගේ දැනුම සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා යොමුකර පුහුණු හා සංවර්ධන වැඩසටහන් සංවිධානය ඇත.

මෙහිදී ආයතනයේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා විවිධ අයුරින් දායක වූ කාර්යමණ්ඩලයට විශේෂයෙන් සඳහන් කළ යුතුයි. විශ්‍රාමික හා දැනට සේවයේ නියුතු රජයේ ජ්‍යේෂ්ඨ නිළධාරීන්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්, පෞද්ගලික අංශයේ ජ්‍යේෂ්ඨ නිළධාරීන් සහ විෂය විශේෂඥයින් දැක්වූ සහයෝගය ද ඉතාමත් වැදගත් වේ.

ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය ස්වකීය ඉලක්ක ගත ගමන් මග තුළ ඉදිරියට යාමට කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හා ලේකම්තුමා ඇතුළු ජ්‍යේෂ්ඨ නිළධාරීන්ගෙන් ලැබුණු මගපෙන්වීම, මෙන්ම නිරන්තර දිරිගැන්වීම මහත් ශක්තියක් වූ බව මෙහිදී සඳහනි කළ යුතුය.

අවසාන වශයෙන් ආයතනය කෙරෙහි මෙන්ම ආයතනයේ පාඨමාලා පුහුණු හා සංවර්ධන වැඩසටහන් කෙරෙහි විශ්වාසය තබා සිය කාර්ය මණ්ඩලය පුහුණුව සඳහා යොමු කළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන ප්‍රධානියා දැක්වූ සහයෝගය කෘතඥතා පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි.

ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන්
අධ්‍යක්ෂ ජනරාල්

පටුන

පිටුව

1.0 ආයතනයේ කටයුතු 1-7

- 1.1 දැක්ම,මෙහෙවර සහ ආයතනයේ වටිනාකම්
- 1.2 ආයතනයේ අරමුණු
- 1.3 ආයතනයේ පරිපාලනය
- 1.4 සංවිධාන ව්‍යුහය
- 1.5 ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

2.0 පුහුණු හා සංවර්ධන 8-17

- 2.1 ඩිප්ලෝමා පාඨමාලා
- 2.2 සහතිකපත්‍ර පාඨමාලා
- 2.3 කෙටිකාලීන සහ සකස් කරගත් පාඨමාලා
- 2.4 ආයතනික පහසුකම්
- 2.5 සම්පත්දායකයින්
- 2.6 2017 වර්ෂයේ මෙහෙයුම් විමසුම
- 2.7 කම්කරු සහ කාර්මික සබඳතා
- 2.8 මානව සම්පත් කළමනාකරණය
- 2.9 කාර්යස්ථාන ඵලදායිතාවය

3.0 මූල්‍ය ප්‍රකාශන 18-36

- 3.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
- 3.2 මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය
- 3.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
- 3.4 ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය
- 3.5 මූල්‍ය ප්‍රකාශන සටහන

4.0 විගණකාධිපති වාර්තාව 37-47

ජාතික ශ්‍රම අධ්‍යයනය ආයතනය (NILS)

1.0 ආයතනය ගැන

ජාතික ශ්‍රම අධ්‍යයනය ආයතනය 2007 සැප්තැම්බර් 11 වැනි දින, 2010 අංක 12 දරන පනත මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සංස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ශ්‍රම අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ සිදු කිරීම සහ පුහුණු සැපයීම් අරමුණින් මෙම ආයතනය පිහිටුවන ලදී. දැනට, මෙම ආයතනය කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කටයුතු කරයි.

අපගේ දැක්ම හා මෙහෙවර

1.1 දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සහ සංහිඳියාව

1.1.1 මෙහෙවර

අධ්‍යපන, පර්යේෂණ සහ පුහුණුව ඔස්සේ ඵලදායි කම්කරු සබඳතාවයන් පවත්වා ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ත්‍රෛයිපාර්ෂවීය කොටස්කරුවන් වෙත පහසුකම් සැලසීම

ප්‍රධාන වටිනාකම්

- ප්‍රතිපාදන සේවාවන්
- පාරිභෝගික කේන්ද්‍රීය වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- වෙනසකට සූදානම් වීම

1.2 අරමුණු

පනතේ ඇතුලත් පහත සඳහන් අරමුණු වෙත ළඟාවීමට ආයතනය විසින් ඉලක්කගත කරනු ලබයි.

1. සංවර්ධන ක්‍රියාවලියේදී, සේවකයන් සක්‍රීය සහකරුවන් කරලීම සඳහා ඔවුන්ගේ සුබසාධනය තහවුරු කිරීමට පියවර ගැනීම සඳහා දේශීය සහ විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් සේවක අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
2. ශ්‍රම අධ්‍යයනය පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ රැස්වීම් පැවැත්වීම සහ එයට අමතරව සඟරා, ජර්නල්, වාර සඟරා සහ පොත්පත් ප්‍රකාශනය කිරීම.
3. ශ්‍රම අධ්‍යයනයට සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම, සමීක්ෂණ පැවැත්වීම සහ අධ්‍යයන පාඨමාලාවක් සැපයීම.
4. පුස්තකාල සහ තොරතුරු සේවාවන් පිහිටුවීම සහ පවත්වාගෙන යෑම.
5. සමාන අරමුණු සහිත දේශීය සහ විදේශීය යන දෙකෙහිම ආයතන, සංවිධාන සංගම් සහ සමාජ සමඟ වඩාත් සමීපයට කටයුතු කිරීම.
6. විශ්ව විද්‍යාල සහ සමාන ආයතනවල සහයෝගිතාවයෙන් ශ්‍රම අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළුව පාඨමාලා පැවැත්වීම සහ එලෙස අවශ්‍ය වූ විටක සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය සිදුකිරීම.
7. කාර්මික සංහිඳියාව පවත්වා ගැනීමේදී, ඉලක්ක කිරීමේදී, ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සම්බන්ධය.

1.3 ආයතනයේ පරිපාලනය

මෙම පනතේ විධිවිධාන පරිදි, පරිපාලනය, කළමණාකරණය සහ ආයතනයේ කටයුතු පාලනය කිරීම ආයතනයේ පාලක මණ්ඩලයක් විසින් සිදු කරනු ලබයි. මෙම මණ්ඩලය කම්කරු අංශයේ ත්‍රෛයිපාර්ෂික කොටස්කරුවන් නියෝජිතයන්ගෙන් සමන්විත වෙයි. එනම්, සේවායෝජකයින්, සේවකයින් (වෘත්තීය සමිති නියෝජනය කරමින්) සහ අදාල ක්ෂේත්‍රයේ විශේෂඥයන් ඇතුළුව රාජ්‍ය නිලධාරීන් පනත මගින් විෂයභාර අමාත්‍යවරයා පැවරී ඇති බලතල පරිදි කම්කරු විෂයභාර අමාත්‍යවරයා විසින් ආයතනයේ පාලන මණ්ඩලය පත්කරනු ලැබේ.

2017 වර්ෂයේදී ආයතනයේ පාලක මණ්ඩලය පහත පරිදි වේ.

1) එස්. ඒ නිමල් සරණතිස්ස මහතා, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය -ලේකම්
2) ඒ.විමලවීර මහතා, කම්කරු කොමසාරිස් ජනරාල් - උපසභාපති
3) ටී. එම්.ජේ.ඩබ්. තෙන්නකෝන් - අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
4) අමන්දා කරුණාතිලක මිය - සාමාජික
5) ඩී. ඒ. එල්. ඉලේපෙරුම මිය - සාමාජික
6) ඩබ්ලිව්.එන්.එස්.වික්‍රමසිංහ මහතා - සමාජික
7) මහාචාර්ය ප්‍රභාත් ජයසිංහ - සාමාජික
8) ජේ.එම්.එන්. ජයසිංහ මහතා - සමාජික
9) ඉසන්කා සමන්මලී විජේවර්ධන මිය - සාමාජික
10) සමන්ති සේනානායක මිය - සමාජික
11) ධර්ම ශ්‍රී වීරසිංහ මහතා - සමාජික
12) ඒ. ලෙස්ලි දේවේන්ද්‍ර මහතා - සමාජික
13) රොහාන්පණ්ඩිත කෝරලගේ මහතා - සමාජික
14) ඩබ්ලිව්.එම්.කේ.එල්.වීරසිංහ මහතා - සාමාජික

1.4 සංවිධාන ව්‍යුහය

අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර පනතේ විධිවිධාන පරිදි ඔහු පත්කරනු ලැබේ. පාලක මණ්ඩලය විසින් කලින් කලට පවරා දෙනු ලබන බලතල, කාර්යන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතුය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය එකිනෙකට වෙනස් අංශ ත්‍රිත්වයක් යටතේ ක්‍රියාත්මක වෙයි. එනම්;

- ❖ පුහුණු සහ සංවර්ධන
- ❖ පර්යේෂණ , සැලසුම් සහ ප්‍රකාශන
- ❖ පරිපාලන සහ මුදල්



පුහුණු හා සංවර්ධන අංශය යටතේ ඒකක තුනක් ඇත. කම්කරු නීති සහ කාර්මික සම්බන්ධතා, මානව සම්පත් කළමනාකරණය සහ සේවා ස්ථාන ඵලදායිතාව වැඩිදියුණු කිරීම එම අංශයි. දැනට මෙම ඒකකවල කාර්යයන් ඉටු කිරීමේදී නිලධාරීන් දෙදෙනෙකු වගකිව යුතු වේ. ආයතනෙය් සියළු ක්‍රියාකාරකම් වල ප්‍රගතිය, අධීක්ෂණය හා ඇගයීම සහ කාලානුරූප වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ, සැළසුම් හා ප්‍රකාශන අංශය වගකිව යුතුය.

පරිපාලන හා මුදල් අංශය ආයතනයෙහි සියලුම පරිපාලන හා මූල්‍ය කටයුතු ඉටු කිරීම සඳහා පහසුකම් සපයයි. අධ්‍යයක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (T & D) සහ ගණකාධිකාරීගේ සෘජු අධීක්ෂණය යටතේ එය ක්‍රියාත්මක වේ.

1.5 ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

සිය වෘත්තීන් වැඩි දියුණු කිරීමේදී ශ්‍රී ලංකා ශ්‍රම බලකායට සහයෝගය දැක්වීම සඳහා ගුණාත්මක බවින් යුත් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සැපයීම මගින් සහභාගිවන්නන්ගේ දැනුම, කුසලතා, සහ ආකල්ප පළල්කිරීම සඳහා ආයතනය බැදී සිටියි. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ අන්තර්ගත විධිවිධාන ප්‍රකාරව, ප්‍රධාන විෂය පථයන් ත්‍රිත්වයක ක්‍රියාකාරකම් ආයතනය විසින් ඉටුකරනු ලබයි.

1. කම්කරු නීතිය සහ කාර්මික සබඳතා
2. මානව සම්පත් කළමනාකරණය
3. වැඩපොළ ඵලදායිතාවය සහ වැඩිදියුණු කිරීම

සමාජ සංවාද ප්‍රවර්ධනය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන්හී ආවරණය පළල් කිරීම ඔස්සේ සේවා සේවක අයිතීන් ආරක්ෂා කිරීම සහ ත්‍රෛයිපාර්ශික කොටස්කරුවන් සවිබලගැන්වීම සඳහා ඉලක්කගත කරන ලද පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ඉටුකිරීම සහ මුල පිරවීම සඳහා කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශය වගකියනු ලැබේ.

මිනිස් කළමනාකරණයේ වඩාත් හොඳ ක්‍රියාකාරකම් භාවිතා කිරීම සඳහා සිය හැකියාව වර්ධනය කරගැනීම මගින් නිෂ්පාදන හෝ සේවාවන් ලබාදීමේ ක්‍රියාවලියේදී කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරලීම සඳහා යටත් නිළධාරින්ගේ කැමැත්තක් ඇතිකරලීම මගින් වෙළඳපල පරිසරය වෙනස් කිරීම සඳහා සංවිධානයන්හි මිනිසුන් කළමණාකරණය කිරීමේ ක්‍රියාකාරකම් සහ විනය වැඩිදියුණු කිරීම සඳහා පාඨමාලා පැවැත්වීම මානව සම්පත් කළමණාකරණ අංශයේ අරමුණයි.

වඩාත් හොඳ ඵලදායී වැඩපළක් ඇතිකරලීම සඳහා සේවක කාර්යය සාධනය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන පාඨමාලා පැවැත්වීම, ප්‍රශ්න වලක්වා ගැනීම සඳහා පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශයක් ගැනීම සඳහා සහ පරිසරය උදෙසා ප්‍රවේශයක් ක්‍රමානුකූලව වෙනස් කිරීම, වැඩපොළ ඵලදායිතාවය සහ වැඩිදියුණු කිරීමේ අංශයේ අරමුණයි.

විසඳුම් සෙවීම සහ ප්‍රතිපත්ති නිර්දේශ ඇති කිරීම සඳහා කම්කරු අංශය තුළ පවතින සහ ඉස්මතු වන ගැටළු සහ ප්‍රශ්න විමර්ශනය සහ විශ්ලේෂණය සඳහා ආයතනය විසින් පර්යේෂණසහ සමීක්ෂණ පැවැත්වීමේ යෙදී සිටියි. මීට අමතරව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන මඟින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ආයතනවල සේවකයන් බඳවාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වෘත්තීයමය ආකාරයේ විභාග පවත්වනු ලැබේ. පර්යේෂණාත්මක හෙළිදරව් කිරීම් සහ අත්දැකීම් පදනම් කරගෙන ජර්නල්, වාර සඟරා, සහ ග්‍රන්ථ පළකිරීම ත්‍රෛයිපාර්ශික කොටස්කාර සාමාජිකයන්ට අධ්‍යාපනය ලබාදීමට සම්බන්ධවීම ආයතනයේ තවත් වැදගත් අංශයකි.

තවද, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව, අනෙකුත් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පුද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් මෙම ආයතනය ක්‍රියාත්මක වෙයි. මීට අමතරව, අන්තර් ජාතික කම්කරු සංවිධානය, කොරියානු අන්තර් ජාතික සහයෝගිතා කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි අන්තර්ජාතික සංවිධාන බලඇණි සමඟ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සම්බන්ධවෙයි. ඒ හා සමාන ඉන්දියානු සංවිධානයක් වන ඉන්දියාවේ වී.වී.ගිරි ජාතික ශ්‍රම ආයතනය සමඟ අනනෝන්‍ය සහයෝගය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර රුසියානු ශ්‍රම ආයතනය සමඟ සාකච්ඡාවක් ආරම්භකර ඇත.

2.0 පුහුණු සහ සංවර්ධන

ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා, කෙටිකාලීන පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය ඔස්සේ පළල් සේවා පරාසයක් ආයතනය විසින් ලබාදෙයි. මීට අමතරව සිය සේවක නිපුණතාවන් වැඩිදියුණුකරලීම සඳහා සේවාදායක සංවිධාන විසින් කරන ලද විශේෂ ඉල්ලීම් මත සකස්කරන ලද වැඩසටහන් පවත්වනු ලබයි. කළමණාකරන සංවර්ධන වැඩසටහන් මාර්ගයෙන් පාසල් හැරගිය වූවන්ගේ සිට ඉහළ වෘත්තීන් දක්වා වූ පරාසයක සමාජයේ විශාල පිරිසකට ආයතනය විසින් සේවාවන් ලබාදෙයි. පුද්ගලික අංශය, වෘත්තීය සමිති නායකයින්, රාජ්‍ය නිලධාරීන් සහ එලෙස වීම සඳහා සේව්‍යයන් හා සේවකයන්ගේ ධාරිතාව වැඩිදියුණු කිරීමට අධ්‍යාපන හා පුහුණු අවස්ථාවන් ලබාගත හැකිය.

2.1 ඩිප්ලෝමා පාඨමාලාවන්

එහි මූලික අධ්‍යාපනික ක්‍රියාකාරකම ලෙස ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින්,

1. කම්කරු නීතිය සහ කාර්මික සබඳතා
2. මානව සම්පත් කලමනාකරණය
3. වැඩපොළ ඵලදායිතාවය ආශ්‍රිතව ඉතාමත් ඉහළ ශාස්ත්‍රීය හා වෘත්තීය මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා ත්‍රිත්වයක් පවත්වනු ලැබේ.

2.2 සහතික පාඨමාලාවන්

වාර්ෂිකව ආයතන මගින් විෂයයන් ත්‍රිත්වයකින් සහතික පත්‍ර පාඨමාලා 24 ක් පවත්වනු ලැබේ. එනම් කම්කරු නීතිය සහ කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ ඩිප්ලෝමා පාඨමලාවන්හී අධ්‍යයන ඒකකයන්ට සහභාගිවීම, වැඩපොළ ඵලදායිතාවය ඉහළ නැංවීම.

2.3 කෙටිකාලීන සහ සකස් කරගත් පාඨමාලාවන්

ප්‍රධාන විෂය කලාපයන් තුල ආයතනය විසින් දින 1 සිට දින 03 දක්වා වූ කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් පවත්වනු ලබයි. තවද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු මධ්‍යස්ථාන වලදී හෝ ඉල්ලීම් කරන සංවිධාන වලදී සේවා දායක ආයතනවල ඉල්ලීම මත ආයතනය විසින් සකස්කරගත් පුහුණු පාඨමාලාවන් පවත්වනු ලැබේ.

2.4 පහසුකම්

සියලුම නූතන පුහුණු පහසුකම් සහිත සම්පූර්ණයෙන්ම වායු සමනය කරන ලද ශ්‍රවණාගාර සහ දේශන ශාලාවලින් ආයතනය සමන්විතය.

2.5 සම්පත් දායකයින්

රට තුල ලබාගත හැකි අදාළ විෂය පථයන් වල ඉහළ සුදුසුකම්ලත්,වඩාත් හොඳ පලපුරුදු සම්පත් පුද්ගලයන් මණ්ඩලයක් හිමිකරගැනීමට ආයතනය වරප්‍රසාද ලබයි. සම්පත් මණ්ඩලය සඳහා විශ්ව විද්‍යාල සහ වෙනත් ජාතික අධ්‍යාපන ආයතනවල වර්තමාන සහ කලින් සිටි විද්වතුන් ,ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, ජේෂ්ඨ කළමනාකරුවන්, අර්ධ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරකයින් ඇතුළු රාජ්‍ය ආයතනවල ජේෂ්ඨ නිලධාරින් සහ කර්මාන්ත විශේෂඥයින් ඇතුළු වෙයි.

2.6 2017 වර්ෂයේ මෙහෙයුම් විමසුම

2017 ක්‍රියාකාරි සැලැස්මට අනුව, එක්දින වැඩසටහන් 52 ක්, දින දෙදින වැඩසටහන් 40 ක් සහ තෙදින වැඩසටහන් 12 ක් පැවැත්වීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සැලසුම් කළේය. එක් දින වැඩසටහන් 51 ක්, දෙදින වැඩසටහන් 40 ක් සහ තෙදින වැඩසටහන් 10 පැවැත්වීම මගින් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හට ඉලක්ක ඉටු කිරීමට හැකි විය. එසේම සේවාලාභීන් විසින් කරන ලද ඉල්ලීම අනුව සකස් කරන ලද පාඨමාලා 23 ක්, සහතික පත්‍ර පාඨමාලා 8ක්, රාජ්‍යය ආයතන සඳහා විභාග 18 ක් ද පවත්වන ලදී. කෙසේ වෙතත්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ඉලක්කය ඩිප්ලෝමා පාඨමාලා 6 ක් වූ නමුත් මේ කාලය තුළ ඩිප්ලෝමා පාඨමාලා 5 ක් පවත්වා ගැනීමට සමත් විය.

2017 දී ආයතනයෙහි මූල්‍ය ඉලක්කය රු. මිලියන 24.3ක් වූ අතර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය රු. මිලියන 31.4ක් ඉපයීමට සමත් වන ලද්දේ ඒ සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා, විභාග, වැඩමුළු ඇතුළත්ව වැඩසටහන් 163 ක් පැවැත්වීම මගින්ය. වගුව - 1 භෞතික හා මූල්‍ය සමාලෝචනය 2017, ප්‍රස්තාරය - 1, ප්‍රස්තාරය - 2 තුළින් වසරේ ප්‍රගතිය පිළිබඳ දත්ත පැහැදිලිව පෙන්නුම් කරයි.

වගුව 1

භෞතික හා මූල්‍ය සමාලෝචන - 2017

වැඩසටහන්	භෞතික		මූල්‍ය (රු.'000)	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
එක්දින වැඩසටහන්	52	51	3,120	3,718
දෙදින වැඩසටහන්	40	40	4,800	5,176
තෙදින වැඩසටහන්	12	10	1,920	1,449
සහතික පත්‍ර පාඨමාලා	12	8	2,340	2,575
විභාග	5	18	200	1,675
ඩිප්ලෝමා පාඨමාලා	6	5	7,155	7,263
බාහිර ඉල්ලීම් මත වැඩසටහන්	12	23	3,840	4,209
වැඩමුළු	4	8	1,020	5,344
එකතුව	**143**	**163**	**24,395**	**31,409**

ප්‍රස්තාරය - 1

භෞතික සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය



ප්‍රස්තාරය - 2

මූල්‍ය සමාලෝචනය - 2017 – ඉලක්ක සහ ප්‍රගතිය (රු.'000)



2.7 කම්කරු නීති සහ කාර්මික සබඳතා

කම්කරු නීති සහ කාර්මික සම්බන්ධතා අංශයයේ මූල්‍ය ඉලක්කය රු. මිලියන 6.0 ක් වූ අතර එය වැඩසටහන් 33කින් සමන්විත වූ අතර ඒවා එක්දින, දෙදින, තෙදින වැඩසටහන්, බාහිර ඉල්ලීම් මත වැඩසටහන්, ඩිප්ලෝමා පාඨමාලාව සහ සහතික පත්‍ර පාඨමාලා හරහා ඉපයීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත් මෙම පුහුණු වැඩසටහන් හේතුවෙන් රු. මිලියන 5.5ක් වැඩසටහන් 18 ක් පැවැත්වීම තුළින් ඉපයීමට හැකිවිය. ප්‍රගතිය පිළිබඳ දත්ත වගුව-2, ප්‍රස්තාරය - 3, ප්‍රස්තාරය - 4 පෙන්නුම් කරයි.

වගුව 2

භෞතික හා මූල්‍ය සමාලෝචන - 2017

කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශය

වැඩසටහන්	**භෞතික**		**මූල්‍ය (රු.'000)**	
	ඉලක්කය	**ප්‍රගතිය**	**ඉලක්කය**	**ප්‍රගතිය**
එක්දින වැඩසටහන්	12	4	720	150
දෙදින වැඩසටහන්	10	5	1,200	558
තෙදින වැඩසටහන්	4	4	640	744
බාහිර ඉල්ලීම් මත වැඩසටහන්	2	2	640	224
ඩිප්ලෝමා පාඨමාලා	2	2	2,310	3,388
සහතික පත්‍ර පාඨමාලා	3	1	585	481
එකතුව	**33**	**18**	**6,ක095**	**5,545**

ප්‍රස්ථාරය - 3

භෞතික සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය

කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශය



ප්‍රස්ථාරය - 4

මූල්‍ය සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය (රු.'000)

කම්කරු නීති සහ කාර්මික සබඳතා අංශය



2.8 මානව සම්පත් කළමනාකරණය

2017 වර්ෂය සඳහා මානව සම්පත් කළමණාකරන අංශයේ මූල්‍ය ඉලක්කය රු. මිලියන 8.2 කි. එය කෙටිකාලීන පාඨමාලා 48 ක් සහ ඩිප්ලෝමා පාඨමාලාව 2 ක් පවත්වමින් ඉපයීම අරමුණ විය. කෙසේ වෙතත් මානව සම්පත් කළමනාකරණ අංශය විසින් අතිවිශිෂ්ට උත්සාහයක් හේතුවෙන් ඩිප්ලෝමා 2 ක් සහ කෙටි කාලීන වැඩසටහන් 54 ක් පවත්වා ගෙන ඇති අතර එය රු. මිලියන 6.8 කි. වගුව - 3 භෞතික හා මූල්‍ය සමාලෝචනය 2017, ප්‍රස්තාරය - 5, ප්‍රස්තාරය - 6 තුළින් වසරේ ප්‍රගතිය පිළිබඳ දත්ත පැහැදිලිව පෙන්නුම් කරයි.

වගුව 3

භෞතික හා මූල්‍ය සමාලෝචන - 2017

මානව සම්පත් කළමනාකරණය

වැඩසටහන්	භෞතික		මූල්‍ය (රු.000')	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
එක්දින වැඩසටහන්	20	23	1,200	1,335
දෙදින වැඩසටහන්	15	11	1,800	776
තෙදින වැඩසටහන්	5	3	800	312
බාහිර ඉල්ලීම් මත වැඩසටහන්	5	14	1,600	750
ඩිප්ලෝමා පාඨමාලා	2	2	2,310	3,018
සහතික පත්‍ර පාඨමාලා	3	3	585	703
එකතුව	**50**	**56**	**8,295**	**6,894**

ප්‍රස්ථාරය: 5

භෞතික සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය

මානව සම්පත් කළමනාකරණය



ප්‍රස්ථාරය: 6

මූල්‍ය සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය (රු.'000)

මානව සම්පත් කළමනාකරණය



2.9 වැඩපොල ඵලදායිතාවය

සේවා ස්ථාන ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ අංශයේ මූල්‍ය ඉලක්කය වූයේ කෙටි කාලීන වැඩසටහන් 46 ක් සහ ඩිප්ලෝමා වැඩසටහන් 1 ක් පැවැත්වීම තුළින් රු. මිලියන 6.8ක් ඉපයීමයි. නමුත් මෙම අංශය කෙටි කාලීන වැඩසටහන් 61 ක් සහ ඩිප්ලෝමා වැඩසටහන් 1 ක් පවත්වමින් රුපියල් මිලියන 9.6 ක් උපයා ගැනීමට සමත්විය. ප්‍රගතිය පිළිබඳ දත්ත වගුව - 4, ප්‍රස්තාරය - 7, ප්‍රස්තාරය - 8 තුළින් පැහැදිලිව පෙන්නුම් කරයි.

වගුව - 4
භෞතික හා මූල්‍ය සමාලෝචන - 2017
වැඩපොල ඵලදායිතාවය

වැඩසටහන්	**භෞතික**		**මූල්‍ය (රු.000')**	
	ඉලක්කය	**ප්‍රගතිය**	**ඉලක්කය**	**ප්‍රගතිය**
එක්දින වැඩසටහන්	20	24	1200	2232
දෙදින වැඩසටහන්	15	24	1800	3842
තෙදින වැඩසටහන්	3	3	480	393
සහතික පත්‍ර පාඨමාලා	3	3	585	962
ඩිප්ලෝමා පාඨමාලා	1	1	1155	847
බාහිර ඉල්ලීම් මත වැඩසටහන්	5	7	1600	1386
එකතුව	**47**	**62**	**6,820**	**9,662**

ප්‍රස්ථාරය - 7

භෞතික සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය

වැඩපොල ඵලදායිතාවය



ප්‍රස්ථාරය - 8

මූල්‍ය සමාලෝචනය 2017 - ඉලක්ක සහ ප්‍රගතිය (රු.'000)

වැඩපොල ඵලදායිතාවය



3.0 මූල්‍ය ප්‍රකාශන

3.1 2017 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශනය

	Note	2017	2016
		Rs.	Rs.
Assets			
Non Current Assets			
Plant and Equipment	14	11,824,902.00	10,326,283.91
Current Assets			
Inventories	15	545,959.42	428,843.79
Receivables	16	12,822,429.17	8,582,078.96
Cash Advances	18	2,002,500.00	121,966.00
Fixed Deposit (BOC)		22,071,383.37	10,393,205.48
Cash & Cash Equivalent	19	6,728,660.08	16,179,257.21
Total Assets		**55,995,834.04**	**46,031,635.35**
Liabilities			
Current Liabilities			
Accrued Expenses	20	1,908,150.62	1,482,319.64
Received in advance	17	434,850.52	531,243.75
Total Net Assets		**53,652,832.90**	**44,018,071.96**
Net Assets/ Equity			
Accumulated Fund			
Balance B/F as at 01.01.2017		44,018,071.96	40,049,284.44
Adjustments in respect of the previous years	21	(759,325.29)	(1,524,600.00)
Adjusted Balance as at 01.01.2017		43,258,746.67	38,524,684.44
Capital Reimbursment	22	3,000,000.00	2,481,015.30
Adjustment for the Period	23	2,244,785.10	2,683,186.61
Excess/(Deficit) for the Year		5,149,301.13	329,185.61
		53,652,832.90	**44,018,071.96**

The accounting policies on pages 07 to 09 and notes on pages 10 to 30 from an integral part of this financial statement. The Board of Directors are responsible for the prepration and presentation of these Financial Statements in accordance with the Sri lanka Public Sector Acounting Standards (SLPSAs). These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Lankika Weerasinghe
Accountant

Lankika Weerasinghe
Accountant
National Institute of Labour Studies
No. 267, Pannipitiya Road,
Pelawatte, Battaramulla.

T M J W Tennakoon
Director General

T.M.J.W. Tennakoon
Director General
National Institute of Labour Studies
No. 267, Pannipitiya Road,
Pelawatta, Battaramulla.

Samanthi Senanayake
Board Member

Samanthi Senanayake
Senior Assistant Secretary (Information Technology)
Ministry of Public Administration & Management
Independence Square - Colombo 07.

S A Nimal Saranatissa
Chairman

S. A. Nimal Saranatissa
Secretary
Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development
Labour Secretariat,
Narahenpita, Colombo 05

1

Final Accounts 2017
National Institute of Labour Studies

3.2 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2017 රු	2016 රු
<u>**මෙහෙයුම් ආදායම**</u>			
පුනරාවර්තන ප්‍රතිපූර්ණය කිරීම	4	11,326,103.20	8,839,191.20
ආදායම	5	3,2910,137.28	23,025,998.92
මුළු ආදායම		**44,236,240.51**	**31,865,190.12**
<u>**මෙහෙයුම් වියදම්**</u>			
පිරිස් වේතන	6	12,369,825.25	10,581,829.58
ප්‍රවාහන	7	751,341.56	826,368.20
භාවිතා කරන ලද සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ	8	1,658,520.36	944,440.22
නඩත්තු කිරීම්	9	1,995,819.44	1,189,802.87
ගිවිසුම්ගත සේවාවන්	10	8,945,746.79	7,886,033.50
ක්ෂය කිරීම්/ක්‍රමක්ෂය	11	1,564,086.85	1,477,524.03
අනෙකුත් මෙහෙයුම් වියදම්	12	1,808,326.28	1,027,122.96
වැඩසටහන් ක්‍රියාකාරකම්	13	9,993,272.85	7,602,883.15
මුළු මෙහෙයුම් වියදම්		**39,086,939.38**	**31,536,004.51**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්ත/හිඟ		**5,149,301.13**	**329,185.61**
<u>මූල්‍ය පිරිවැය</u>			
බැංකු ගාස්තු		**-**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් දළ අතිරික්ත හිඟ		**5,149,301.13**	**329,185.61**

3.3 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	**2017 රු**	**2016 රු**
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය**</u>			
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්ත/හිඟ		5,149,301.13	329,185.61
ගැළපීම්:			
වැටුප්, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු	23.1	1,563,007.04	2,683,186.61
මෙහෙයුම් ක්‍රියාකාරකම්	24	(77,547.23)	(524,600.00)
ක්ෂය ගණනය කිරීම	11	1,564,086.85	1,477,524.03
සක්‍රිය ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ		**8,198,847.79**	**3,965,296.25**
ඉන්වෙන්ටරිය තුළ වැඩිවීම/අඩුවීම	15	(117,115.63)	(265,378.42)
ලැබීම් තුළ වැඩිවීම/අඩුවීම	16	(4,240,350.21)	(4,536,318.01)
අමාත්‍යාංශ ගිණුම් තුළ වැඩිවීම/අඩුවීම			89,500.00
මුදල් අත්තිකාරම් තුළ වැඩිවීම/අඩුවීම		(1,880,534.00)	(121,966.00)
උපචිත තුළ වැඩිවීම/අඩුවීම	20	425,830.98	1,263,760.50
අත්තිකාරම් හි ලැබුණ ආදායම වැඩිවීම/අඩුවීම	17	(96,393.23)	522,243.75
මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල්		**2,290,285.70**	**917,138.07**
මූල්‍ය පිරිවැය		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් දළ මුදල් ප්‍රවාහ		**2,290,285.70**	**917,138.07**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ**</u>			
පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	14.1	(3,062,704.94)	(2,276,439.62)
ප්‍රාග්ධන ප්‍රතිපූර්ණය	22	3,000,000.00	2,481,015.30
ස්ථිර තැම්පත්		11,678,177.89	10,393,205.48
ආයෝජන ක්‍රියාකාරකම්වලින් දළ මුදල් ප්‍රවාහ		**(11,740,882.83)**	**(10,188,629.80)**
මුදල් සහ ඊට සමාන දේවල් හි දළ වැඩිවීම/අඩුවීම		(9,450,597.13)	(9,271,491.73)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ ඊට සම දේවල්	19	16,179,257.21	25,450,748.9419
වර්ෂය අවසානයේදී මුදල් සහ ඊට සම දේවල්	19	**6,728,660.08**	**16,179,257.21**

3.4 කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය - 2017 දෙසැම්බර් 31 වෙනි දිනට

	2017 (රු.)
2017.01.01 දිනට ඉ/ගෙ මුළු අරමුදල් ශේෂය	**44,018,071.96**
පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ගැලපීම	(759,325.29)
2017.01.01 දිනට ගලපන ලද ශේෂය	**43,258,746.67**
ප්‍රාග්ධන ප්‍රතිපූර්ණය කිරීම	3,000,000.00
කාලසීමාව සඳහා ගැලපීම	2,244,785.10
වර්ෂය සඳහා අතිරික්ත/හිඟ	5,149,301.13
2017.12.31 දිනට ශේෂය	**53,652,832.90**

3.5 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

1. ආයතන තොරතුරු

1.1 සාමාන්‍ය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අංශය ප්‍රතිව්‍යුහගත කරමින් කම්කරු විෂය භාර අමාත්‍යාංශය යටතේ 2007 වර්ෂයේ සප්තැම්බර් හිදී මෙම ආයතනය පිහිටුවන ලදී. පාර්ලිමේන්තුව විසින් 2012 අංක 12 දරන පහත ක්‍රියාත්මක කිරීම මගින් එය නීත්‍යානුකූලව පිහිටුවන ලදී. පහත පරිදි සේවා යෝජකයින්. වෘත්තීය සමිති සහ රාජය නිලධාරින් නියෝජනය කරමින් සේවකයින් ඇතුළු කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශික කොටස්කරුවන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත පාලන මණ්ඩලයක් විසින් ආයතනය පාලනය කරනු ලැබේ. මෙම ආයතනය අංක 267, පන්නිපිටිය පාර,පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ආයතනයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ පුහුණු වැඩසටහන්, කම්කරු නීතිය සහ කාර්මික සබඳතා, වැඩ පොළ ඵලදායිතාවය ඉහළනැංවීම සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම සහ පර්යේෂණ සහ ප්‍රකාශන පැවැත්වීම.

1.3 ආයතන කාර්යය මණ්ඩලය

2007 සැප්තැම්බර් සිට ආයතනය විසින් එහි මෙහෙයුම් ආරම්භ කළද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සේවක සංඛ්‍යාව අනුමත කිරීම 2014 මාර්තු වලදී ලබාගෙන ඇත. එවැනි තත්වයක් යටතේ, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආයතන වෙත මෙහෙයුම් කාර්ය මණ්ඩලයක් ලබා දී ඇති අතර එම නිලධාරීන්ගේ වැටුප් අදාළ සංවිධාන විසින් ගෙවා ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් සේවක පිරිස් වේතන සහ වැටුප් දීමනා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මෙන්ම කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ.

1.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය කළමනාකරණය

ආයතනයේ මූලාරම්භයේ සිට 2011 සැප්තැම්බර් 30 වන දින දක්වා ආයතනයේ මූල්‍ය ළමනාකරණය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ විසින් සිදුකර ඇත.(කාර්ය මණ්ඩලය සහ වෙනත් බාධක හේතුවෙන්)

2. සූදානම් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය,මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශය සඳහා වූ සටහන් වලින් සමන්විත වෙයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී.

2.2 මිණුම් පදනම

මූල්‍ය ප්‍රකාශනයක් උපචිත පදනම මත පිළියෙළ කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනයන්ගේ උද්ධමනීය කාරණාවන් සඳහා ගැලපීම් සිදුකර නැත.

2.3 පවතින ව්‍යාපාර

පවතින ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට ඇති හැකියාව ස්ථාපිත කිරීමේ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති අතර ඔවුන් විසින් ඇවර කිරිමට හෝ වෙළඳ කටයුතු අවසන් කිරීමට අදහස් නොකරයි.

2.4 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිරන්තරව යොදවා ඇති අතර, එම නිසා පසුගිය වර්ෂයේ භාවිතා කළ ඒවා සමඟ ඒවා අනුකූල නොවෙයි. වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවකදී පසුගිය වර්ෂයේ දත්ත තොරතුරු සහ ප්‍රකාශනයන් නැවත සකස්කර ඇත.

2.5 ක්‍රියාකාරි සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරි මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියළුම කාල සීමාවන් සඳහා නිරන්තරව යොදවා ඇත.

3.1 දේපළ , පිරියත, සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය යනු වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි වැඩකරන තත්වයට ගෙන ඒමේදී සිදු වූ යම් යම් වියදම් සමඟ එන අත්පත් කරගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයයි. පිරිවැයේදී වත්කමක් ලෙස මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නැවත අගය කරන ලද වත්කම් එයින් ඇතිවන කිසියම් ක්ෂය වීමක් අඩුකිරීමෙන් අනතුරුව නැවත අගය කරන ලද ප්‍රමාණයෙන් ගෙනයනු ලබයි. අනෙකුත් සියලුම වත්කම්, පිරියත සහ උපකරණ වල සමුච්චිත ක්ෂය අඩුකර පිරිවැය සඳහන් කරනු ලැබේ. වෙනස් භාවිතයට ගත හැකි ජීවන කාලයක් පවතින ප්‍රධාන උපාංග වලින් පිරියත සහ උපකරණ අයිතමයක් සමන්විත වන අවස්ථාවන්හිදී, එම දේපළ, පිරියත සහ උපකරණ වල වෙනම අයිතමයක් ලෙස ගණනය කරනු ලැබේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අවශ්‍ය පරිදි වත්කම් අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය විමර්ශනය කර සකස්කර ගනු ලැබේ. තක්සේරුගත ප්‍රයෝජනවත් කාලයට වැඩියෙන් පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් වලට වඩා සියලුම දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය අයකරනු ලැබේ. බැහැර දිය හැකි දිනය දක්වා භාවිතය සඳහා වත්කම් ලබාගත හැකි දිනයන් ක්ෂය වීම් ලබා දී ඇත. තවද SLPSAS 7-දේපළ පිරියත හා උපකරණ හී විස්තරකර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමයට ගණනය කර ඇති බව පහත දක්වා ඇති පරිදි සරල රේඛීය ක්‍රමයක් මත පිරියත හා උපකරණ ක්ෂය ගණනය කරනු ලැබේ.

භාවිතකරන ලද මූලික වාර්ෂික අනුපාතයන් පහත පරිදි වේ;

	2017
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වර්ෂ 10
ලී භාණ්ඩ හා එහි උපකරණ	වර්ෂ 13 (7.5%)
පරිගණක	වර්ෂ 10
වාහන	වර්ෂ 10
නාම පුවරු හා වෙනත්	වර්ෂ 3
පොත්පත්	**වර්ෂ 5**

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013.10.02 දිනට දේපළ, පිරියත හා උපකරණ නැවත තක්සේරු කර ඇති 2014.01.07 දින අදාල වාර්තාව නිකුත් කරන ලදී. 2014 වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීම 2014.01.01 දින ප්‍රතිතක්සේරුව ගණනය කිරීම ගණනය කර ඇත. වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිලදීගැනීම් පිරිවැය පදනම මත ගනනය කර ඇත. ක්ෂය අනුපාතයේ සැලකිය යුතු වෙනසක් පවතින බවට සංඥාවක් පවතීනම්, වත්කම් අවශේෂ වටිනාකමේ ප්‍රයෝජනවත් ජීවන කාලය එම වත්කම ක්ෂයවීම නව අපේක්ෂාව ප්‍රත්‍යාවර්තනය කිරීම සඳහා සංශෝධනය කරනු ලැබේ. මුලින් තක්සේරුගත ක්‍රියාකාරි ප්‍රමිතීයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ

පවත්වා ගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ පවත්වා ගැනීම පෙර නඩත්තු කිරීම් පිළිබඳ සිදුවූ වියදම දරන ලද වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.2 ඉන්වෙන්ටරි

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරන ලද බඩු වට්ටෝරු පිරිවැයේදී ආදායම් සහ වියදම් ප්‍රකාශනය සඳහා අයකර තිබිණි.

3.3 මුදල් සහ සම වටිනාකම්

මුදල් සහ සම වටිනාකම් අතති මුදල් හා බැංකුවල තැන්පත්කරන මුදල් වලින් සමන්විත වෙයි.

3.4 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැදීමක් පවතින විට ශේෂ පත්‍රය තුල වගකීම් හඳුනාගනු ලැබේ. ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් පිටතට ගලායෑමක් එහි නිරවුල් කරලීමෙන් අපේක්ෂා කරනු ලබයි. ණයකරුවකුගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් ඇතුලත ගෙවිය යුතු බැදීම ශේෂ පත්‍රයේ වර්තමාන වගකීම් ලෙස සැලකෙයි. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස, විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි වර්තමාන නෛතික හෝ අනුමත බැදීමක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා ඇත්නම් ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර බැදීම් නිරවුල් කරගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායෑමක් අවශ්‍ය බව හිතාගත හැකිය.

3.5 අදායම හඳුනාගැනීම

භාණ්ඩ ලබා දී පවරා ඇති අවස්ථාවක භාණ්ඩ/සේවාවන්ගේ අළවියෙන් ආදායම හඳුනාගනු ලැබේ. සලකා බලන ලද ලැබීම් සහ ලැබිය හැකි සාධාරණ වටිනාකම්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එකතුකරගත් බදු ආශ්‍රිත අඩු කිරීම් හා අළවිකිරිම් දළ අගයෙන් ආදායමක් දක්වනු ලැබේ.

3.5.1 ආදායම් පදනම

සහභාගිවන්නන් ගෙවීම් සිදු කිරීමේදී උපචිත පදනම මත ආදායම් ගණනය කරනු ලැබේ.නොවැළැක්විය හැකි හේතුන් නිසා සමහර සහභාගිවන්නන් විසින් සම්පූර්ණ කිරීමට පෙර පාඨමාලා අත්හරිනු ලබන අතර විවිධ හේතුන් නිසා සමහරක් පාඨමාලා ගාස්තුන් අයකරගත නොහැකිය. මෙම ලැබීම් ආදායමක් ලෙස සලකා බලා නොමැත කෙසේවෙතත්, හැකිනම් ඉතිරි ප්‍රමාණය අයකර ගැනීම සඳහා ක්‍රියා මාර්ග ගනු ලැබේ. පාඨමාලාවේ සමස්ත ආදායම තීරණය කරනු ලබන්නේ පාඨමාලාවේ වර්ෂය සඳහාය.

3.6 ලැබීම්

අයහපත් සහ සැකසහිත ලැබීම් සඳහා දළ දීමනා වටහාගැනීමට තක්සේරු කර ඇති බවට වෙළඳ ලැබීම් ප්‍රමාණයන්ගෙන් සටහන් කරන ලදී. අදාළ ලාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් හා අයවීම් අයහපත් සහ සැක සහිත ලැබීම් සඳහා දීමනාවන් පිරිවැයෙන් අඩු කරනු ලබයි.

3.7 නිර්වචනය කරන ලද දායක මුදල් සැළසුම්

නිර්වචනය කරන ලද දායක මුදල් සැලැස්මක් යනුවෙන් අදහස්කරන්නේ වෙනම කොටසකට ස්ථාවර දායකමුදල් ගෙවන කොටසක් යටතේ වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැළැස්මක් වන අතර වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නෛතික හෝ අනුමිත බැදීමක් නොමැත.සෑම සේවකයෙක්ම ආවරණය කරනු ලබන සේවක අර්ථ සාධක අරමුදලට දායක වීම සඳහා වු බැදීම් සිදුවූ පාඩු හෝ ලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ. අර්ථ සාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ලෙස සේවක යන්ගේ දළ වේතනයන් 12% සහ 3% ක් සමාගම දායක මුදල් ගෙවයි.

3.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමවේදයක් භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 4	2017	2016
<u>පුනරාවර්තන ප්‍රතිපූර්ණය කිරීම</u>	රු.	රු.
පුනරාවර්තන ප්‍රතිපූර්ණය කිරීම	11,326,103.23	8,839,191.20
මුළු එකතුව	**11,326,103.23**	**8,839,191.20**

සටහන : 5	2017	2016
<u>ආදායම</u>	රු.	රු.
ඩිප්ලෝමා පාඨමාලා	7,263,000.00	6,236,250.00
සහතික පත්‍ර පාඨමාලා	2,575,000.00	1,574,000.00
එක්දින වැඩසටහන්	3,718,050.00	3,453,200.00
දෙදින වැඩසටහන්	5,176,700.00	3,039,000.00
තෙදින වැඩසටහන්	1,449,000.00	1,932,800.00
විශේෂ වැඩසටහන්	4,209,088.00	1,875,000.00
විභාග ආදායම	1,675,490.00	208,360.00
ILO ව්‍යාපෘති	-	1,901,243.75
වැඩමුළු	5,344,625.00	583,525.00
වෙනත් ආදායම්	1,499,184.28	2,222,620.17
මුළු එකතුව	**32,910,137.28**	**23,025,998.92**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 6	2017	2016
<u>සේවක වේතන</u>	රු.	රු.
කාර්ය මණ්ඩල වැටුප්	4,039,618.17	1,962,686.46
අමාත්‍යාංශ කාර්යමණ්ඩල වැටුප්	1,563,007.04	1,802,896.47
දෙපාර්තමේන්තුකාර්යමණ්ඩල වැටුප්	-	880,290.14
අනුයුක්ත වැටුප	2,402,843.24	2,530,275.74
අනුයුක්ත දීමනා	345,273.50	460,584.86
විශ්‍රාම වැටුප් දායක මුදල්	331,166.65	355,404.50
කළමනාකරණ ගාස්තු	412,500.00	450,000.00
වැඩබැලීමේ දීමනා	204,746.03	116,014.36
වැටුප්	648,975.00	717,475.00
අධ්‍යක්ෂජනරාල්ගේ ඉන්ධන	-	-
EPF දායක මුදල්	874,235.38	427,183.08
ETF දායක මුදල්	131,136.14	63,277.44
නිවාඩු දින ගෙවීම්	122,947.15	119,235.90
අතිකාල	396,946.81	178,145.14
වෙනත් දීමනා	422,894.64	29,282.81
පාලන මණ්ඩල වියදම්	218,854.00	320,689.68
විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වියදම්	95,981.50	115,108.00
සාමාන්‍ය විගණන ගාස්තු	158,700.00	53,280.00
මුළු එකතුව	**12,369,825.25**	**10,581,829.58**

සටහන : 7	2017	2016
<u>ප්‍රවාහන වියදම්</u>	රු.	රු.
දේශීය	65,563.50	38,609.30
විදේශීය	685,778.06	787,758.90
මුළු එකතුව	**751,341.56**	**826,368.20**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන: 8	2017	2016
සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය	රු.	රු.
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	1,371,584.38	798,748.22
පුවත් පත්	19,120.00	22,070.00
ඉන්ධන	259,815.98	123,622.00
ආහාර සහ නිළ ඇඳුම්	8,000.00	
මුළු එකතුව	**1,658,520.36**	**944,440.22**

සටහන : 9	2017	2016
නඩත්තු කිරීම්	රු.	රු.
වායුසමන යන්ත්‍ර අළුත්වැඩියාව	105,674.40	84,836.41
පරිගණක නඩත්තුව	126,005.00	33,130.50
කාර්යාල නඩත්තුව	1,305,510.51	806,207.48
වාහන නඩත්තුව	458,629.53	265,628.48
මුළු එකතුව	**1,995,819.44**	**1,189,802.87**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 10	2017	2016
ගිවිසුම්ගත සේවාවන්	රු.	රු.
ගොඩනැගිලි බදු කුළී	4,550,000.00	4,200,000.00
දුරකථන	399,812.32	331,566.79
පවිත්‍රතා වියදම්	1,493,996.80	1,393,366.12
විදුලිය	813,027.58	764,407.38
ජලය	58,677.69	72,662.92
තැපැල් ගාස්තු	320,225.00	242,100.00
සේවා ගිවිසුම්	190,931.29	274,986.92
ආරක්ෂක ගාස්තු	983,877.18	566,614.60
රැඳවුම් බද්ද	135,198.93	40,328.77
මුළු එකතුව	**8,945,746.79**	**7,886,033.50**

සටහන : 11	2017	2016
ක්ෂය කිරීම	රු.	රු.
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	574,851.13	525,156.38
ලී භාණ්ඩ සහ උපකරණ	353,280.36	340,612.29
පරිගණක	590,600.00	355,600.00
නාම පුවරු සහ වෙනත්	30,010.00	240,810.00
පොත්	15,345.36	15,345.36
මුළු එකතුව	**1,564,086.85**	**1,477,524.03**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 12	2017	2016
වෙනත් මෙහෙයුම් වියදම්	රු.	රු.
වෙළඳ දැන්වීම් සහ ප්‍රවර්ධන	1,480,510.57	904,630.96
කාර්යාල සුභසාධනය	119,661.00	119,492.00
ප්‍රවාහන වියදම්	161,000.00	3,000.00
වෙනත් වියදම්	47,154.71	
මුළු එකතුව	**1,808,326.28**	**1,027,122.96**

සටහන: 13	2017	2016
වැඩසටහන් ක්‍රියාකාරකම්	රු.	රු.
දේශන ගාස්තු	3,236,887.50	2,287,076.40
ආහාරපාන	2,630,954.75	2,080,765.25
විභාග වියදම්	1,093,425.50	485,350.00
පුහුණු සහ සංවර්ධන	-	1,019,956.05
ත්‍යාග ප්‍රධානෝත්සව	-	327,145.45
ව්‍යාපෘති වියදම්	3,032,005.10	1,402,590.00
මුළු එකතුව	**9,993,272.85**	**7,602,883.15**

සටහන : 14	2017	2016
පිරියත සහ උපකරණ (14.1)	රු.	රු.
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	3,910,721.13	3,988,624.82
ලී භාණ්ඩ සහ අදාළ කොටස්	3,475,038.74	3,659,411.60
පරිගණක	4,374,040.00	2,614,640.00
නාම පුවරු සහ වෙනත්	34,066.06	17,226.06
පොත්	31,036.06	46,381.43
මුළු එකතුව	**11,824,902.00**	**10,326,283.91**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 15	**2017**	**2016**
ඉන්වෙන්ටරිය (15.1)	රු.	රු.
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	264,187.98	230,322.35
කාර්යාල උපකරණ නඩත්තුව	281,771.44	198,521.44
මුළු එකතුව	**545,959.42**	**428,843.79**

සටහන : 16	**2017**	**2016**
ලැබිය හැකි ආදායම (16.1)	රු.	රු.
එක්දින වැඩසටහන	450,000.00	502,000.00
දෙදින වැඩසටහන	815,500.00	318,000.00
තෙදින වැඩසටහන	272,000.00	564,800.00
විශේෂ වැඩසටහන	2,850,588.00	
ඩිප්ලෝමා ආදායම	4,850,000.00	2,970,750.00
සහතික පත්‍ර පාඨමාලා	672,000.00	486,000.00
සේවාස්ථ වැඩසටහන්		329,000.00
වැඩමුළු	1,249,500.00	76,500.00
විභාග	1,552,840.00	43,900.00
වර්තන ප්‍රතිපූර්ණ		549,223.16
ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ	110,001.17	941,603.30
විදේශ පුහුණු - ඉන්දියාව		1,785,482.50
බොයිලේරු වියදම් STC		14,820.00
මුළු එකතුව	**12,822,429.17**	**8,582,078.96**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017න.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 17	2017	2016
අත්තිකාරම් ලැබීම	රු.	රු.
UN Women ව්‍යාපෘතිය	434.850.52	531,243.75
මුළු එකතුව	**434.850.52**	**531,243.75**

සටහන : 18	2017	2016
මුදල් අත්තිකාරම්	රු.	රු.
සේවක ණය	2,500.00	57,166.00
මුදල් අත්තිකාරම් - ඩිප්ලෝමා ඇඳුම්	2,000,000.00	64,800.00
මුළු එකතුව	**2,002,500.00**	**121,966.00**

සටහන: 19	2017	2016
මුදල් හා ඒ හා සමාන	රු.	රු.
ලංකා බැංකුව , නුගේගොඩ A/C 0071451995	6,728,660.08	16,179,257.21
මුළු එකතුව	**6,728,660.08**	**16,179,257.21**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 20	2017	2016
<u>උපචිත වියදම්</u> (21.1)	රු.	රු.
අතිකාල	5,026.88	4,750.83
වැඩබැලීමේ ගාස්තු	727.27	52,272.86
ගෘහස්ථ ගමනාගමනය	4,550.00	
පුවත්පත්	80.00	460.00
ආරක්ෂක ගාස්තු	83,562.17	83,562.17
ජලය	6,065.38	3,119.73
පිරිසිදු කිරීමේ වියදම්	110,457.90	133,995.61
දුරකථන	34,729.47	34,348.31
කාර්ය මණ්ඩල වැටුප්	27,801.54	8,712.00
වැටුප්	4,500.00	8,000.00
ETF	2,613.46	512.13
EPF	392.86	76.82
කාර්යාල උපකරණ නඩත්තුව		5,936.29
වෙනත් ගෙවීම්	349,352.06	2,965.89
විශ්‍රාම වැටුප්		2,202.00
ත්‍යාග ප්‍රධානෝත්සව		21,000.00
සාමාන්‍ය විගණන වියදම්	158,700.00	218,880.00
විභාග	362,472.50	101,525.00
Monitoring & Evaluation – SLAVA	256,200.00	800,000.00
ඩිප්ලෝමාව ව්‍යාපෘති වියදම්	30,107.03	
විදුලිය	77,393.10	
Secondment දීමනා	131,119.00	
Lecture fee	232,400.00	
ප්‍රචාරණ ගාස්තු	29,900.00	
මුළු එකතුව	**1,908,150.62**	**1,482,319.64**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 21	2017	2016
<u>පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ප්‍රතිතක්සේරු කිරීම ගැළපීම</u>	රු.	රු.
විගණන ගාස්තු	(1,920.00)	(165,600.00)
කෙටිකාලීන වැඩසටහන්	(284,800.00)	(153,000.00)
ඩිප්ලෝමා වැඩසටහන්	(275,500.00)	
මෝටර් රථ		(1,250,000.00)
ක්ෂය සඳහා ප්‍රතිපාදන : මෝටර් රථ		250,000.00
ව්‍යාපෘති වියදම් -ILO		(150,000.00)
අමාත්‍යාංශ ගිණුම්		(56,000.00)
වැඩබැලිමේ ගාස්තු	626.36	
ඩිප්ලෝමා ත්‍යාග ප්‍රදානය	18,000.00	
විභාග වියදම්	400.00	
UN ව්‍යාපෘතිය	(531,243.75)	
රැඳවුම් බද්ද	(8,079.81)	
ස්ථිර තැන්පතු පොළිය	323,191.91	
මුළු එකතුව	**(759,325.29)**	**(1,524,600.00)**

සටහන : 22	2017	2016
<u>ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ</u>	රු.	රු.
ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ (23.1)	3,000,000.00	2,481,015.30
මුළු එකතුව	**3,000,000.00**	**2,481,015.30**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

සටහන : 23	2017	2016
වර්තමාන වර්ෂය සඳහා ගැලපීම් 2017	රු.	රු.
අමාත්‍යාංශ කාර්යය මණ්ඩල වැටුප් (23.1)	1,563,007.04	1,802,896.47
දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල වැටුප්		880,290.14
විදේශ සංචාර- අධ්‍යක්ෂ ජනරාල්	670,478.06	
මෝටර් රථ නඩත්තු - අධ්‍යක්ෂ ජනරාල්	11,300.00	
මුළු එකතුව	**2,244,785.10**	**2,683,186.61**

සටහන : 24	2017	2016
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගැලපීම්	රු.	රු.
සාමාන්‍ය විගණන වියදම්	(1,920.00)	(165,600.00)
කෙටිකාලීන වැඩසටහන්	(284,800.00)	(153,000.00)
ඩිප්ලෝමා වැඩසටහන්	(275,500.00)	
ව්‍යාපෘති වියදම් -ILO		(150,000.00)
අමාත්‍යාංශ ගිණුම්		(56,000.00)
වැඩබැලිමේ ගාස්තු	626.36	
ඩිප්ලෝමා ත්‍යාග ප්‍රදානය	18,000.00	
විභාග වියදම්	400.00	
UN ව්‍යාපෘතිය	(531,243.75)	
රඳවුම් බද්ද	(8,079.81)	
ස්ථිර තැන්පතු පොළිය	323,191.91	
විදේශ සංචාර- අධ්‍යක්ෂ ජනරාල්	670,478.06	
මෝටර් රථ නඩත්තු - අධ්‍යක්ෂ ජනරාල්	11,300.00	
මුළු එකතුව	**(77,547.23)**	**(524,600.00)**

4.0 විගණකාධිපති වාර්තාව

C 79

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එල්ඊඩබ්/ඒ/එන්අයිඑල්එස්/1 /17

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2018 ඔක්තෝබර් 05 දින

සභාපති,

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා සහ සබරගමු සංවර්ධන අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එන්අයිඑල්එස්/1 /17

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 05දින

සභාපති,

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ අංක 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජුනි 30 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

2. මූල්‍ය ප්‍රකාශනය

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයෙහි 40 වන ඡේදය ප්‍රකාරව පොළී ලැබීම් වලින් වන මුදල් ප්‍රවාහයන් එකිනෙක වෙනම හෙළිදරව් කළ යුතු වුවද වර්ෂයට අදාල පොලී ප්‍රමාණය රු.1,467,752 ක් හා පොලී මුදලට අදාල රදවාගැනීම් බදු රු.210,385 ක් හා වර්ෂයේ ආයෝජනය කල රු.10,000,000 ක ගෙවීම් ගැලපීම් කර මුදල ගලා යාමක් ලෙස රු.11,678,177 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයෙහි 69 ඡේදයේ ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළයුතු වන්නේ වත්කම භාවිතා කිරීම සඳහා සූදානම් තත්වයට පත් කිරීමෙන් පසුව වුවද ආයතනය විසින් ඉහත නියමයන්ට අනුකූල නොවන ලෙස මිලදී ගත් වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.280,819 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ආයතනය විසින් ප්‍රවර්ධන කටයුතු සඳහා රු.553,526 ක් වැයකර ටී ෂර්ට් මුද්‍රණය කර ඇති අතර ඒ සඳහා දරන ලද සම්පූර්ණ මුදලම වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි. 2017දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.181,322 ක් වටිනා තොගයක් ඉතිරිව තිබුණ අතර මෙම ප්‍රමිතයේ ඡේද 12 හි (ඌ) පරිදි ආයතනය විසින් එම ඉතිරි තොගය වර්ෂ අවසාන තොග ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.181,322 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10

ප්‍රමිතයෙහි ඡේද 19 ට අනුව සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනීමේදී වාර්තා කරන දිනට ගනුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගතයුතු බව දක්වා තිබුණද, ආයතනය විසින් 2017 වර්ෂය තුළ පවත්වන ඩිප්ලෝමා පාඨමාලා වෙනුවෙන් රු. 7,263,000 ක මුදලක් ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණද එම ආදායම තුළ 2018 වර්ෂයට අදාල පාඨමාලා ආදායමද වර්ෂයට අදාල ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ පාඨමාලා සහ වැඩසටහන් වලින් ලැබිය යුතු ආදායමෙන් වාර්ෂිකව මුදල් අයකරගත නොහැකි සහ පාඨමාලා නවතා දැමූ සිසුන්ගේ ලැබිය යුතු මුදල් අය නොවන අවස්ථා පැවතියද ආයතනය විසින් ඒ සඳහා අඩමාන ණය වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු දෙකක පොලී ආදායම වන රු.592,885 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

4

(ආ) ආයතනය වැටුප් ගිණුම්ගත කිරීමේදී දළ වැටුප වෙනුවට ශුද්ධ වැටුප ගැලපීම නිසා සේවක වැටුප් රු.349,694 කින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලට අදාළව ආයතනය විසින් දරන සියයට 12 ක ප්‍රමාණය වන රු.524,541 ක් පමණක් ආයතනයේ වියදමක් ලෙස නිරූපණ කළ යුතු වුවත් සේවකයාගෙන් අඩු කරන ප්‍රතිශතය ඇතුළුව සියයට 20 ක ප්‍රමාණය වන රු.874,235 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් දායකය ආයතනයේ වියදමක් ලෙස නිරූපණය කර තිබීම නිසා රු.349,694 කින් වර්ෂයේ අතිරික්තය අඩු වී තිබුණි.

(ඈ) 2016 – 2017 වර්ෂයේ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන් 10 දෙනෙකුට අදාල පාඨමාලා ආදායම ලෙස එක් අයෙකුගෙන් රු.77,000 බැගින් රු.770,000 ක් 2016 වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් සිසුන් පාඨමාලාව අතහැර දැමීම හේතුවෙන් තවදුරටත් ආයතනයට ලැබිය යුතු රු. 441,500 ක උපලබ්ධි නොවූ ආදායමක් ලෙස සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත් රු.275,500ක මුදලක් පමණක් ගලපා තිබුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 17 වගන්තිය ප්‍රකාරව, පනතෙහි 4 උප වගන්තිය යටතේ දක්වා ඇති අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සමිති අධ්‍යයන අංශයක් පිහිටුවා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,149,301 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.329,186 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,820,115 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආයතනයේ මෙහෙයුම් වියදම් රු. 7,550,935 කින් වැඩි වුවද මෙහෙයුම් ආදායම රු.9,884,139 කින් සහ භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු.2,486,912 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

5

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.502,932 ක්වූ අතිරික්තය උච්චාවචනයක් සහිතව 2017 වර්ෂය වනවිට රු.5,149,301 දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සහ සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.2,458,919 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.14,718,856 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

ආයතනය කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර යෝජිත ඉලක්ක ලඟා කර ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතු වුවත් එසේ සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ප්‍රධාන අරමුණක් වුවද එම අරමුණු ඉටුකිරීම සඳහා පුස්තකාලයක් පැවතියද සිසුන්ගේ පරිහරණය සඳහා එය විධිමත් ලෙස පවත්වාගෙන යෑමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සඟරා, ජර්නල, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරීම ආයතනය පිහිටු වූ පනතේ අරමුණක් වුවද ඒ සඳහා උපායමාර්ගික වැඩපිළිවෙලක් ආයතනය සතු නොවීය.

(ඇ) 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ දී දායක (Donor funded) ව්‍යාපෘති 3 ක් සඳහා රු.මිලියන 1.5 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් කිසිදු දායක ව්‍යාපෘතියක් සිදු කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ දී ආයතනය විසින් පරීක්ෂණ ව්‍යාපෘති (Research project) දෙකක් සඳහා රු.මිලියන 1 ක් ඇස්තමේන්තු කර තිබුනි. නමුත් රු.මිලියන 1.2 ක් වැයකර පරීක්ෂණ ව්‍යාපෘති 1 ක් පමණක් සිදු කර තිබුණි. ආයතනය විසින් ලගා කර නොගත් ඉලක්කය සියයට 50 ක් විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පවත්වනු ලබන එක් දින, දෙදින, තුන්දින හා විශේෂ වැඩසටහන් සඳහා එම වැඩසටහන් පවත්වන දින හෝ ඊට පෙර ගෙවීම් කරන ලෙස ආයතනය විසින් සහභාගීවන්නන්ට දන්වා තිබුණ ද එය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් සඳහා ආයතන 08 කින් රු.92,000 ක් 2018 වර්ෂයේ මාර්තු වන තුරුත් අයකර ගැනීමට නොහැකි වී තිබූ බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා පැවැත්වෙන දින හෝ ඊට ප්‍රථම ගෙවීම් කරන ලෙස ආයතනය විසින් ශිෂ්‍යයන් වෙත දන්වා තිබුණද ආදායම් එකතු කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතා හේතුවෙන් 2016 වර්ෂයේදී පවත්වා තිබුණු කෙටිකාලීන පාඨමාලා වෙනුවෙන් අයකරගත නොහැකි වූ පාඨමාලා ගාස්තු ලෙස රු.284,800 ක් කපාහැර තිබුණි.

(ඇ) හදුනාගන්නා ලද ආදායම උපලබ්ධිවීම පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවති අතර පසුගිය වර්ෂ 03 ක විශේෂ වැඩසටහන්, ඩිප්ලෝමා පාඨමාලා, වැඩමුළු හා විභාග පැවැත්වීමෙන් ලැබිය යුතු රු.10,502,928 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය කරගත නොහැකි වී තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ කාන්තා ආයතනය (UN Women) සහ ශ්‍රම අධ්‍යයන ආයතනය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව 2016 අප්‍රේල් 1 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාන්තාවන් සේවයේ යෙදීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල යුතු විය. නමුත් ව්‍යාපෘති මුදලින් සියයට 72 ක් උපයෝජනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූලික සමීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි. ඉහත ජාත්‍යන්තර ආයතනයේ මුල්‍ය රීති පිළිපැදීමට ආයතනය අපොහොසත් වීම මත ලබා දුන් අත්තිකාරම් මුදලින් රු. 558,263ක මුදලක් එම ආයතනය වෙත 2017 සැප්තැම්බර් 04 දින නැවත ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ආයතනයේ ආරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා පෞද්ගලික ආරක්ෂක ආයතනයක් යොදාගෙන තිබූ අතර ගිවිසුම ප්‍රකාරව ගිවිසුම් කාලය 2017 ඔක්තෝම්බර් 16 දිනෙන් අවසන් වන නමුත් නැවත කාලය දීර්ඝ කිරීමකින් තොරව 2017 දෙසැම්බර් මාසය දක්වා සේවා ලබාගෙන එම කාලය සඳහා රු.247,990 ක මුදලක් ගෙවා තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

ආයතනය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුමේ 2017 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා රු.4,275,752 සිට රු.21,411,748 වූ පරාසයක ශේෂයන් පැවතුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය පරිදි හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 4(ඉ) වගන්තිය ප්‍රකාරව අදාල පාර්ශවයන්ගේ නිසි අනුමැතිය ලබාගෙන අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ඉපයීම කෙරෙහි ආයතනය අවධානය යොමුකර නොතිබුණි. එම චක්‍රලේඛයේ 4.2.5 ප්‍රකාරව ආයතනයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.

8

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 වන විට ආයතන සඳහා අනුමත කාර්ය මණ්ඩලය 45 ක් වන අතර ආයතනයේ ඉහළ කළමණාකාරිත්වයට අයත් පුරප්පාඩු 03 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් ද ද්විතියික මට්ටමේ පුරප්පාඩු 10 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද වශයෙන් සේවක පුරප්පාඩු 22 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න දැනුවත් වී නොතිබුණි.

(අ) 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සංදිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

මු.රෙ 133(ආ) පරිදි ආයතනයේ අභ්‍යන්තර විගණනය 2017 තුලදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් සිදුකරන නමුත් 2017 වර්ෂය තුලදි ආයතනය සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් පවතින නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

6.2 අයවැය ලේඛනමය පාලනය

ආයතනයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 100 සිට 506 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ) තොරතුරු තාක්ෂණ පොදු පාලනයන්	ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා නොතිබීම.
(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය	(i) ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව, ස්ථානය සහිතව ලංසු කැඳවීමේ දැන්වීම් සකස් නොකිරීම
	(ii) ලංසු විවෘත කිරීමේ කමිටු අනුමත කර නොතිබීම
	(iii) ලංසු විවෘත කිරීම වාර්තා කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමිත ආකෘති සහතික කර නොතිබීම හා කමිටු සාමාජිකයන් අත්සන් කර නොතිබීම
	(iv) ලංසු කැඳවීමේ ලේඛන ආයතනයේ අවශ්‍යතාවට නොගැලපෙන ලෙස කෙටුම්පත් කර තිබීම

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති